ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය -2024 (2025) පෙරහුරු ප්‍රශ්න පත්‍රය

| 11 ශ්‍රේණිය | නැටුම් (දේශීය) I - II | කාලය - පැය 03 යි |
|---|---|---|

**විශේෂ උපදෙස්**

- **සියලු ම අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න 30 ට ම පිළිතුරු සැපයිය යුතුය. එයට අමතරව උඩරට නර්තනය කොටසේ ප්‍රශ්න 10 ට ද පිළිතුරු සැපයිය යුතුය.**

  **- සැලකිය යුතුයි. -**

  **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) වරණ අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**

---

**I කොටස**

- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.**

01. ආංගික අභිනයේදී හිස, කඳ, දෑත්, දෙපා යන ශරීර කොටස් ................................ ලෙස හැඳින්වේ.
    1. අංග 2. ප්‍රත්‍යංග 3. උපාංග 4. අනු උපාංග

02. නර්තන ඉතිහාසය හා සබැඳි කරුණු ඇතුළත් පහත සඳහන් ........................................ සෙල්ලිපිය අනුරාධපුර යුගයට අයත්වේ.
    1. පාලමොට්ටායි 2. යාපහුව දළදා මාළිගය
    3. මුල්කිරිගල රජමහ විහාර 4. සැස්සේරුව

03. ශ්‍රී ලංකාවට පැමිණි විදේශ ජාතිකයකු වූ ........................................ දෙවිනුවර උපුල්වන් දේවාලයේ නැටුම් පිළිබඳ විස්තර කර ඇත.
    1. පාහියන් භික්ෂුව 2. ඉබන් බතුතා 3. රොබට් නොක්ස් 4. ස්පිල් බර්ජන්

04. ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ සිට පැමිණි තැනැත්තෙකු ලෙස සැලකෙන්නේ සොකරි නාටකයේ ප්‍රධාන චරිතයක් වන ................................. ය.
    1. වෙදරාල 2. ආඬිගුරු 3. පරයා 4. කාලි අම්මා

05. රබාන ....................................... නමින් ද හැඳින්වේ.
    1 පොකුරු බෙරය 2. එඩක්ක 3. එකැස් බෙරය 4. පුංග් බෙරය

06. හපනා ගිනි හොරා හා කුමුදුනී යන මුද්‍රා නාට්‍ය හඳුන්වාදීමේ ගෞරවය හිමි වන්නේ .................................... මහත්මියටය.
    1. අංජලිකා චිත්‍රසේන 2. මිරැන්ඩා හේමලතා
    3. චන්ද්‍රලේඛා පෙරේරා 4. වජිරා චිත්‍රසේන

07. කෝලම් නාටකයේ එන .................................... කෝලම අපර රංගයක් ලෙස කරළියට පැමිණේ
    1. ජස කෝලම 2. මුදලි කෝලම
    3. නාග රාක්ෂ කෝලම 4. ලෙන්චිනා කෝලම

08. ත්‍රිවිධ ලයට සරඹ අභ්‍යාස කිරීමේදී සිව්ගුණ ලෙස නම් කරනුයේ ............................ ලය වේ.
    1. විලම්භ 2. ධෘත 3. මධ්‍ය 4. අතිධෘත

09. කොහොඹා කංකාරියේ දක්නට ලැබෙන අංගයක් වන ............................... ගායනා රහිත නර්තන අංගයක් වේ.

1. ආවැන්දුම 2. කුවේණි අස්න 3. කොහොඹාහෑල්ල 4. ගිරිදේවි

10. ''දිවි කදුරුද ගස චීතැන තියෙන්නේ'' මෙය .............................. නැටුමේ ගායනයකි.

1. මෝග්ලස් 2. කඩු 3. ගොයම් 4. කුළු

11. පොළොන්නරු යුගයේදී ''සරස්වතී මණ්ඩපය'' ඉදිකරනු ලැබුයේ පහත නම් සඳහන් රජු විසිනි.

1. නිශ්ශංක මල්ල 2. සයවන පරාක්‍රමබාහු
3. දෙවන පරාක්‍රමබාහු 4. මහා පරාක්‍රමබාහු

12. ශෝක හා ක්‍රෝධ යන භාවයන් තුළින් ජනිත වන්නේ,

1. ශෘංගාර හා රෞද්‍ර රසයන්ය. 2. කරුණා හා රෞද්‍ර රසයන්ය
3. ශෘංගාර හා භීභත්ස්‍ය රසයන්ය 4. කරුණා හා ශෘංගාර රසයන්ය

13. කෝලම් නාටකයේ රංග මඩල හඳුන්වනු ලබන්නේ,

1. කරළිය නමිනි 2. වෙස් අත්ත නමිනි
3. තානායම්පොළ නමිනි 4. කමත නමිනි

14. කොලොන්න පද හා මුගුරු පද යන නර්තනාංග අයත් ශාන්තිකර්මය වන්නේ

1. දෙවොල්මඩු ශාන්තිකර්මය 2. කොහොඹාකංකාරි ශාන්තිකර්මය

3. පහන්මඩු ශාන්තිකර්මය 4. රටයකුම ශාන්තිකර්මය

15. මනිපුරි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය පැළඳ ගනිමින් ඉදිරිපත් කරන නර්තන අංගය වන්නේ

1. රාස්ලීලා 2. පරෙංග් 3. සංකීර්තන් 4. පුංචෝලම්

16. ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා (නෘත්‍ය) නාට්‍ය වන ''සීතාහරණ'' නිෂ්පාදනය කරන ලද්දේ,

1. රබීන්ද්‍රනාත් තාගෝර්ය 2. ශාන්ති දේවිගෝෂ්ය
3. නිමල් වෙල්ගමය 4. චිස්. පණීභාරතය

17. කරදිය මුද්‍රා නාට්‍යයේ මන්නඩි රාළගේ චරිතය නිරූපණය කරන ලද්දේ,

1. නිමල් වෙල්ගම මහතාය 2. සෝමබන්දු විද්‍යාපති මහතාය
3. චිත්‍රසේන මහතාය 4. චිස්. පණීභාරත මහතාය

18. ''ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ඉරු දෙවි අධිපති වන්නේ'', මෙම කවි පදය අයත් වන්නේ,

1. කොහොඹාකංකාරිය ශාන්තිකර්මයටය 2. මඩු ශාන්තිකර්මයටය
3. බලි ශාන්තිකර්මයටය 4. සූනියම් ශාන්තිකර්මයටය

19. උඩරට නර්තන සම්ප්‍රදායේ අංගහාර සකස් කර ගැනීම සඳහා ගොඩ සරඹ නර්තනය කරන අතර පිළිවෙලින් පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායේ චී සඳහා යොදාගනු ලබන්නේ,

1. ඉලංගම් සරඹ හා මණ්ඩි පද 2. ඉලංගම් සරඹ හා දොඹින පද
3. මණ්ඩි පද හා දොඹින පද 4. අත් සරඹ හා මණ්ඩි පද

20. නන්දිකේශ්වර විසින් රසභාව පිළිබඳ පළ කරන ලද කෘතිය වන්නේ,

1. නාට්‍ය ශාස්ත්‍රය ය 2. සීලප්පදිකාරම් ය
3. අභිනය දර්පණය ය 4 භගවත්ගීතාව ය

- **අංක 21 සිට 24 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න.**

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| A | තබ්ලාව | මෘදංගය | මංජිරා | චෙන්ඩාව |
| B | ලෙහෙගා | ඇසෑමය | දෘපට්ටා | කේරලය |
| C | කොක්තුම්බි | රාක්කඩි | කිරිටම් | උත්තරීයම් |

21. භරත සහ කථකලි නර්තනයට යොදා ගන්නා අවනද්ධ වාද්‍ය භාණ්ඩ දැක්වෙන්නේ,

1. C පේළියේ 1 හා 3 තීරුවේය
2. A පේළියේ 2 හා 3 තීරුවේය
3. A පේළියේ 2 හා 4 තීරුවේය
4. B පේළියේ 1 හා 3 තීරුවේය

22. මණිපුරි සහ කථකලි නර්තනයට පළඳිනු ලබන ශීර්ෂාභරණ දැක්වෙන්නේ,

1. C පේළියේ 1 හා 3 තීරුවේය
2. C පේළියේ 2 හා 4 තීරුවේය
3. C පේළියේ 2 හා 3 තීරුවේය
4. B පේළියේ 1 හා 3 තීරුවේය

23. කථක් නර්තනයට යොදා ගන්නා ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය දැක්වෙන්නේ

1. A පේළියේ 1 තීරුවේය
2. A පේළියේ 2 තීරුවේය
3. A පේළියේ 4 තීරුවේය
4. A පේළියේ 3 තීරුවේය

24. කථකලි නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශය සඳහන් වන්නේ,

1. B පේළියේ 1 තීරුවේය
1. B පේළියේ 2 තීරුවේය
3. B පේළියේ 3 තීරුවේය
4. B පේළියේ 4 තීරුවේය

25. "උඩරට නර්තන කලාව" හා "නෘත්‍ය රත්නාකරය" යන ග්‍රන්ථ රචනා කළ ගත්කතුවරයා වන්නේ,

1. ආරියරත්න කලුආරච්චි මහතාය
2. ඊ. ඒ. දෙල්ගොඩ මහතාය
3. ජේ. ඊ. සේදරමන් මහතාය
4. ජයසේන කෝට්ටගොඩ මහතාය

26. කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්තිකර්ම තුනෙහිම දක්නට ලැබෙන අංග වන්නේ

1. දළුමුර පිදීම, කප් සිටුවීම, මඩු පේ කිරීම ය
2. හත් පද, කප් සිටුවීම, මඩු පේ කිරීම ය
3. මඩු පේ කිරීම, නානුමුර කිරීම, කොලොන්න පද නැටීමය
4. හත් පද පෙළපාලිය, දළුමුර පිදීම, යහන් දැක්මය

27. මෙම රූපයෙන් දැක්වෙන කෝලම් මුහුණ පැළඳ කරනු ලබන චරිතය හඳුන්වන්නේ,



1. ජස කෝලම ලෙසය
2. නොංචි කෝලම ලෙසය
3. මුදලි කෝලම ලෙසය
4. පොලිස් කෝලම ලෙසය

28. ගායනා සහිත නර්තන අංග ඇතුළත් පිළිතුර තෝරන්න.

1. පත්තිනි, තොරන් යාගය, කොලොන්න පද
2. කොහොඹාහෑල්ල, පත්තිනි, කොලොන්න පද
3. කොහොඹාහෑල්ල, තොරන් යාගය, මුගුරු පද
4. කොහොඹාහෑල්ල, තොරන් යාගය, දෙවොල්

29. කොහොඹා කංකාරියේදී බෙර වාදකයන්ගේ දක්ෂතාවය මැනවින් පෙන්නුම් කරන අවස්ථාවක් වන්නේ,

1. අත්‍යා බෙර වාදනය 2. මඟුල් බෙර වාදනය
3. පිං බෙර වාදනය 4. හත් පද සඳහා වාදනය

30. ගද්‍ය හා පද්‍ය කොටස් දෙකින්ම සමන්විත කවි වර්ගයක් වන්නේ

1. මල් යහන් කවි 2. මඩුපුරේ කවි 3. ටීකා සී පද 4. නමස්කාර

## II කොටස - උඩරට නර්තනය

31. බර අත් ගෙන කගින් …………………………….. යන කවියේ අනෙක් කවි පාදය වන්නේ,

1. අසුරන් කළ යුදෙන් 2. ඇන කොන්ත්අවි වලින්
3. සුරිඳුන් පෙර සිටන් 4. දෙපලුව අසුර සෙන්

32. කොහොඹ කංකාරි ශාන්තිකර්මයේ ඉදිරිපත් කෙරෙන ඒකල නර්තනයකි.

1. අස්න නැටුම 2. යක්කැනුම 3. මඩු පුරය 4. කොතල පදය

33. "තාකු තක්කුං තරිකිට තකුද තත්ජෙං" යන අඩව්ව නර්තනය කෙරෙනුයේ

1. මුසලඩි වන්නමටය 2. සැවුලා වන්නමටය
3. සිංහරාජ වන්නමටය 4. තුරඟා වන්නමටය

34. "දොං දොං පිං පිං ගජිගත" බෙර පදය ප්‍රස්තාරගත කිරීමට සුදුසු තාල රූපය වන්නේ

1. සුළු මැදුම් දෙතිතය 2. මැදුම් මහ දෙතිතය
3. සුළු මහ දෙතිතය 4. සුළු තනිතිතය

35. වෙස් ඇඳුම් කට්ටලයේ හිසට සහ පපු ප්‍රදේශයට පළඳින ආභරණ වන්නේ

1. හඟල සහ අවුල් හැරයයි 2. නෙත්තිමාලය සහ අවුල් හැරයයි
3. ඉන පටිය සදහ අවුල් හැරයයි 4. කෙමෙත්ත සහ අවුල්හැරයයි

36. කොහොඹාකංකාරියේ නාට්‍යමය පෙළපාලියක් වන්නේ,

1. කොහොඹා හෑල්ලය 2. මඩුපුරය සහ මල් හත් පදයය
3. දුම්මල පදයය 4. ගුරුගේ මාලාවය

37. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් කස්තිරමක් ඇතුළත් වරණය කුමක්ද?

1. රුඳග පිත්තක තකට කුංදත් ….. 2. රුද ගජිත රුද ගජිත …..
3. රුඳ ගත ගත ගත කුකුදත් 4. රුංතක පිංතක පිංතක පිංකුද …..

38. තනි තිතේ තාල රූපයකට වාදනය කළ හැකි උඩරට නර්තන සම්ප්‍රදායේ බෙර පදය තෝරන්න.

1. දෝං පිං පිං තකට දොංතක 2. දොං පිංත ගත දොංත
3 දොදොංත තකු දොම් 4. දොං දොං පිං පිං ගජිගත

39. "කොහොඹායක් කංකාරිය හා සමාජය" කෘතිය රචනා කරන ලද්දේ,

1. මහාචාර්ය ජයසේන කෝට්ටගොඩය 2. මහාචාර්ය ආරියරත්න කළුආරච්චිය
3. මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂය 4. මහාචාර්ය මුදියන්සේ දිසානායකය

40. උඩරට වන්නමකට අයත් කොටස් ගණන

1. තුනකි 2. හතරකි 3. පහකි 4. හයකි

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1. | (1) | - | අංග |
| 2. | (4) | - | සැස්සේරුව |
| 3. | (2) | - | ඉබන් බතුතා |
| 4. | (2) | - | ආඩිගුරු |
| 5. | (3) | - | එකැස් බෙරය |
| 6. | (4) | - | වජිරා චිත්‍රසේන |
| 7. | (3) | - | නාග රාක්ෂ කෝලම |
| 8. | (2) | - | ධෘත |
| 9. | (1) | - | ආවැන්දුම |
| 10. | (1) | - | මෝල්ගස් |
| 11. | (4) | - | මහා පරාක්‍රමබාහු |
| 12. | (2) | - | කරුණා හා රෞද්‍ර රසයන්ය |
| 13. | (3) | - | තානායම්පොල |
| 14. | (3) | - | පහන් මඩු ශාන්තිකර්මය |
| 15. | (4) | - | පුංගේචෝලම් |
| 16. | (2) | - | ශාන්ති දේවිඝෝෂ්ය |
| 17. | (3) | - | චිත්‍රසේන මහතාය |
| 18. | (3) | - | බලි ශාන්තිකර්මයටය |
| 19. | (2) | - | ඉලංගම් සරඹ හා දොඹින පද |
| 20. | (3) | - | අභිනය දර්පණයය |
| 21. | (3) | - | A පේළියේ 2 හා 4 තීරුවේය |
| 22. | (1) | - | C පේළියේ 1 හා 3 තීරුවේය |
| 23. | (1) | - | A පේළියේ 1 තීරුවේය |
| 24. | (4) | - | B පේළියේ 4 තීරුවේය |
| 25. | (3) | - | ජේ. ඊ. සේදරමන් මහතාය |
| 26. | (2) | - | හත්පද, කප් සිටුවීම, මඩු පේ කිරීමය |
| 27. | (2) | - | නොංචි කෝලම ලෙසය |
| 28. | (4) | - | කොහොඹාහෑල්ල, තොරන් යාගය, දෙවොල් |
| 29. | (1) | - | අත්‍යා බෙර වාදනය |
| 30. | (3) | - | ටීකා සී පද |
| 31. | (2) | - | ඇන කොන්ත්අවි වලින් |
| 32. | (4) | - | කොතල පදය |
| 33. | (1) | - | මුසලඩි වන්නමටය |
| 34. | (3) | - | සුළු මහ දෙතිතය |
| 35. | (2) | - | නෙත්තිමාලය සහ අවුල්හැරයයි |
| 36. | (4) | - | ගුරුගේ මාලාවය |
| 37. | (1) | - | රුඳග පිත්තක තකට කුංදත් |
| 38. | (3) | - | දොදොංත තකු දොම් |
| 39. | (4) | - | මහාචාර්ය මුදියන්සේ දිසානායකය |
| 40. | (4) | - | හයකි |

## නැටුම් (දේශීය) II

- පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමිවේ.

01. සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

i. චිදා හෙළදිව කෘතිය ………………………………… විසින් රචනා කරන ලදී.

ii. රස හා භාව පිළිබඳව ……………………………………… ගේ නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථයේ සඳහන් වේ.

iii. කෝලම් නාටකයේ වේදිකාව වන තානායම්පොලෙහි ප්‍රධාන සැරසිල්ල …………………………………………… යි.

iv. සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව පණ්ඩුකාභය රජු ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරන වූ බව ……………………………………….. සඳහන් වේ.

v. ගද්‍ය පද්‍ය කොටස් දෙකකින් සමන්විත ……………………………….. පද ජන ගායනා විශේෂයකි.

vi. කිරීටම් නැමැති හිස් පළඳනාව ……………………………… නර්තන සම්ප්‍රදායේ දී භාවිත කරයි.

vii. මහනුවර යුගයේ ශ්‍රී වීර පරාක්‍රම රජු සමයේදී වන්නම් රචනා වූයේ …………………….. දීය.

viii. රාජ්‍ය පාලන කටයුතුවලදී යුද්ධ සේනා ධෛර්යමත් කිරීමට ………………………. වාදනය යොදාගෙන ඇත.

ix. පහත සඳහන් නර්තනාංග ඇතුළත් නර්තන සම්ප්‍රදාය මොනවාද?

(අ) රාස්ලීලා - ………………………………..

(ආ) පදම් - ………………………………..

x. උඩරට නර්තනයේ කස්තිරම වන්නට සමාන වන පහතරට හා සබරගමු නර්තන කොටස හඳුන්වන නම් සඳහන් කරන්න.

(අ) පහතරට - ………………………………..

(ආ) සබරගමු - ………………………………..

02. i. මාත්‍රා 2 + 2 + 3 තාල රූපයට අයත් බෙර පදයක් ප්‍රස්තාරගත කරන්න.

ii. “ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට හිරු දෙව් අධිපති වන්නේ” යන කවි පදය මහ තනිතිතට අවග්‍රහයෙන් ප්‍රස්තාරගත කරන්න.

iii. සැවුලා වන්නමට අයත් අඩව්ව ප්‍රස්තාර කරන්න.

03. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. කුඹි කතාව

ii. නර්තනයෙන් ගොඩ නැගෙන සාරධර්ම

iii. හේවිසි වාදනය

iv. වන්නම්

v. ආංගික අභිනය

04. ශාන්තිකර්ම වූ කලී දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිඹිබු කරන සාධකයකි.

i. කොහොඹා කංකාරියේ ශාන්තිකර්මයේ ගායනා රහිත ශාස්ත්‍රීය නර්තන අංග දෙකක් නම් කර ඉන් සියලුම යක්දෙස්සන් එකතුව නර්තනය කරන ප්‍රථම නර්තන අංගය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

ii. සබරගමු පහන් මඩුවේ සැරසිලි පිළිබඳ විමසීමක් කරන්න.

iii. දෙවොල් මඩු ශාන්තිකර්මයේ කතා පුවතින් සමාජයට ලබාදෙන පණිවිඩය පිළිබඳ විමසීමක් කරන්න.

05. i. සොකරි හා කෝලම් නාටකවල එන චරිත දෙක බැගින් නම් කරන්න.

ii. කෝලම් නාටකය පැවැත්වීමේ අතීත හා වර්තමාන අරමුණු සැකෙවින් විස්තර කරන්න.

iii. සොකරි නාටකයට අයත් චරිත දෙකක් විස්තර කෙරෙන කවි දෙකක් ලියා දක්වන්න.

06. පහත දැක්වෙන A, B සහ C රූප ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B



C



i. A රූපයෙන් දැක්වෙන මුද්‍රා නාට්‍යය නම් කර, ඒ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

ii. B රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර, එහි භාවිත වේශ නිරූපණ ක්‍රම දෙකක් හඳුන්වන්න.

iii. C රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය කුමක්ද? එම සම්ප්‍රදායේ චරිත නිරූපණය හා සම්බන්ධ නර්තන අංගයක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

07. i. නර්තන කලාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි මූලාශ්‍ර 4 ක් නම් කරන්න.

ii. ඉවසීම ප්‍රගුන කිරීමෙහිලා නර්තනය මගින් ලැබෙන පිහිවහල උදාහරණ සහිතව දක්වන්න.

iii. පහත දැක්වෙන කරුණු ඇසුරින් නර්තන කලාවේ ප්‍රවණතා විවිධාකාරයෙන් ඉදිරියට ගමන් කර ඇති බව විමසුමට ලක් කරන්න.

1. රංග වස්ත්‍රාභරණ

2. තාත්ෂණික මෙවලම්

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

<u>**පිළිතුරු - II**</u>

01. i. රොබට් නොක්ස්

ii. භරතමුණි

iii. වෙස් අත්ත

iv. මහාවංශයේ

v. ටීකා සී

vi. කථකලි

vii. කවිකාර මඩුවේ

viii. රණ බෙර

ix. (අ) මනිපුරි

(ආ) භරත

x. (අ) ඉරට්ටි

(ආ) කලාසම

PAST PAPERS WIKI

**WWW.PastPapers.WiKi**

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සුභාර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**